**දැරණියගල ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කල මතය
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දැරණියගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සභාව සතු අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 26 ක් වූ ඉඩම් කොටස් 03 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
---------------------

ගිණුම් විෂයයන් 07 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.87,793,506 ක් වූ නමුත් ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව එකතුව රු.81,049,292 ක් වූයෙන් රු.6,744,214 ක වෙනසක් විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
---------------------

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක් ඉක්මවූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.4,185,292 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්
---------------------

2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ක් ඉක්මවා තිබුණු ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 26,788,268 ක් විය.

1.4 අනුකූල නොවීම්

-------------------

1.4.1 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ------------------------------- | ------------------- | ------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය | 556,826 | අක්කර බදු ගෙවීම් පැහැර හරින විටදී අදාළ ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන හෝ මුදල් අයකරගත යුතු වුවත් හිඟ අක්කර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ.571 | 649,575 | 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,759,325 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,174,378 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,685,830 | 6,389,414 | 4,786,702 | 1,602,712 | 5,641,340 | 5,686,446 | 4,335,414 | 1,351,032 |
| (ii) | කුලී | 4,722,200 | 4,772,278 | 4,676,778 | 95,500 | 4,559,350 | 4,433,899 | 4,417,411 | 16,488 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 607,600 | 750,080 | 750,080 | - | 377,250 | 707,878 | 707,878 | - |
| (iv) | වෙනත් ආදායම් | 106,762,030 | 75,355,738 | 31,484,538 | 43,871,200 | 78,193,664 | 63,372,595 | 21,030,461 | 42,342,134 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු ආදායම් සියයට 23 කින් වැඩි වී තිබූ අතර වරිපනම් හා බදු, කුලී හා වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 16,1 හා71 කින් අඩු වී තිබුණි.

2.2.3 වරිපනම් හා බදු

වරිපනම් බදු අයකල හැකි දියුණු ප්‍රදේශ කලින් කල හඳුනාගෙන නම් කිරීමට කටයුතු කළයුතු වුවත් ඒ පිළිබඳව පසුගිය වර්ෂ 10 ක් තුළ කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙළඳ බලපත්‍ර

(අ) බලපත්‍ර ගාස්තු

බලපත්‍ර ආදායම් ලේඛනය අනුව කර්මාන්ත හා ව්‍යාපාර බදු ගෙවිය යුතු ස්ථාන 806 ක වෙළඳ බලපත්‍ර සඳහා මුදල් අයකර තිබුණද බලපත්‍ර 165 ක් පමණක් නිකුත්කර තිබුණි. ඒ අනුව ආයතන 641 ක් 2017 දෙසැම්බර් 11 දින වනවිටත් නියමිත සුදුසුකම් සහිතව පවත්වාගෙන යන බව තහවුරු නොවුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල කර්මාන්ත හා ව්‍යාපාර බදු ගෙවිය යුතු ව්‍යාපාර ස්ථාන පිළිබඳ සමීක්ෂණ පවත්වා ස්ථාන 579 ක් පමණක් හඳුනාගෙන තිබුණද බලපත්‍ර ආදායම් ලේඛන අනුව අයකිරීම් කළ ස්ථාන 806 සමග සැසඳීමේදී ස්ථාන 227 ක අඩුවීමක් තිබුණු බැවින් විධිමත් සමීක්ෂණයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති අති විශේෂ ගැසට්පත්‍රය ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත 14 ක් බලපත්‍ර ලබා නොගැනීම නිසා රු. 56,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. එමෙන්ම එකී ආයතන පරිසර අධිකාරියේ කොන්දේසි / ප්‍රමිතිවලට අනුව එම ව්‍යාපාර පවත්වාගෙන යන බව තහවුරු නොවුණි.

2.2.5 වෙනත් ආදායම්

------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 1988 අගෝස්තු 23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ, පළාත් පාලන අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබූ සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන භාවිතා කිරීමෙන් හෝ ඒ සම්බන්ධ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමෙන් තොරව දැන්වීම් පුවරු ආදායම් සඳහා වාර්ෂිකව ගැසට් පත්‍රයේ පලකර ගාස්තු අයකර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 13 දින සභාවේ ආදායම් පාලක සමග සිදුකල ක්ෂේත්‍ර නියදි පරීක්ෂාවේදී දැන්වීම් පුවරු 53 ක් ප්‍රදර්ශනය වන බව අනාවරණය වුවද, එදිනට පැවති දැන්වීම් පුවරු 45 ක් වෙනුවෙන් පමණක් රු. 79,950 ක් අයකරගෙන නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 5,705,445 ක් හා මුද්දර ගාස්තු රු. 3,066,774 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------------

දැරණියගල බස් නැවතුම්පොළ ආශ්‍රිතව වෙළඳ පල කඩ කාමර 51 ක් ඉදිකිරීමට 2015 වර්ෂයේදී සැළසුම් කර එයින් කඩකාමර 29 ක් සඳහා එක්වන් මුදල් (key money) රු.24,299,000 ක් අයකරගෙන තිබුණද 2018 අප්‍රේල් වනවිටත් කඩ කාමර ඉදිකිරීම් කර නොතිබුණි.

(ආ) පාරිසරික ගැටළු

------------------

සභා බල ප්‍රදේශය තුල පවත්නා සුසාන භූමිය කසළ බැහැර කිරීම සඳහා භාවිතා කර තිබුණු බැවින් ප්‍රදේශවාසීන්ට මෘතශරීර ආදාහනය සඳහා අධික වියදම් සහ අමතර පරිශ්‍රමයක් දරමින් වෙනත් ප්‍රදේශ වෙත යාමට සිදුවී තිබුණි. ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී මිල ගණන් ලබාගෙන තිබුණද 2018 ජූනි වනවිටත් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

විධිමත් කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් හඳුනාගෙන තිබුණද ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් සභා බල ප්‍රදේශයේ එක්රැස් කරනු ලබන කැළි කසළ හා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ විධිමත් පරිදි බැහැර කිරීමේ ක්‍රමවේදයකින් තොරව, සීතාවක ගඟ ආසන්නයේ පිහිටි සුසාන භූමියෙහි විවෘත ස්ථානයකට

බැහැර කර තිබුණි.මේ හේතුවෙන් වැසි දිනවලදී අපද්‍රව්‍ය ගංගා ජලයට මිශ්‍රවීම හා සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට සුසාන භූමිය භාවිතා කිරීමේ අපහසුතා පැනනැගී තිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

(අ) (i) සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ජල යෝජනාක්‍රම දෙකෙන් කහබටේ ජල යෝජනාක්‍රමය සඳහා ක්ලෝරීන් යොදා ජලය පිරිසිදු කිරීම කලත් කිසිදු අයුරකින් පිරිසිදු කිරීම් නොකරන ලිහිනියාගල ජල යෝජනාක්‍රමයේ ජලය සමග මිශ්‍රකර බෙදා හැරීම නිසා ජල පාරිභෝගිකයන්ට පිරිසිදු පානීය ජලය සැපයීමට සභාව අසමත් වී තිබුණි.එකී ජල යෝජනාක්‍රම වලින් සපයන ජලයේ අහිතකර බැක්ටීරියා අඩංගු බවට දැරණියගල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ පරීක්ෂණ වාර්තා මගින් තහවුරු වී තිබුණි.

(ii) උක්ත ජල ව්‍යාපෘතීන් සඳහා ගබඩා ටැංකියක් නොමැතිව ජලය බෙදාහැරීම කරන බැවින් වැසි දිනවලදී වැලි සහ අපද්‍රව්‍ය සමග ජලය භාවිතා කිරීමට ජල පාරිභෝගිකයින්ට සිදුව තිබුණි. ඒ හේතුවෙන් ජල පරිභෝගිකයන් වෙත ලබා දී ඇති ජලමනු හානියට පත්වීම සාමාන්‍ය තත්වයක් බවට පත්වී තිබුණු අතර ජල මනු වලින් සියයට 50 කට වඩා අක්‍රීය බැවින් නිවැරදි ජල ගාස්තු අයකිරීමට නොහැකිවී තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මක කුඩා ජල විදුලි බලාගාර 03 ක් සම්බන්ධව ව්‍යාපාර ආරම්භ කිරීමේදී ලබාගත යුතු ගොඩනැගිලි අනුමත කිරීම සිදුකර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය
------------------------------

3.3.1 වත්කම් පවරා නොගැනීම
------------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් ලබා දී තිබුණු රු. 44,188,520 ක් වටිනා වාහන 06 ක් හා සබරගමුව පළාත් සභාව මගින් ලබා දී තිබුණු රු.7,460,875 ක් වටිනා වාහන 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.3.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
--------------------------------------------

වාහන නිසි පරිදි අළුත්වැඩියා නොකිරීම නිසා සභාව සතු වාහන 02 ක් භාවිතයට ගෙන නොතිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂය සඳහා පොදු අරමුදල් යටතේ ඇස්තමේන්තු කර තිබූ රු.2,125,000 ක් වටිනා කර්මාන්ත 12 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) දැරණියගල බස්නැවතුම්පොල පොදු වැසිකිලිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තයේ ඇස්තමේන්තුවේ විෂයය අංක 5 යටතේ යුරිනල් 2 ක් සවිකිරීම සඳහා රු.57,072 ක් ගෙවා තිබුණද එම විෂයයන් සඳහා වෙළඳපල සාමාන්‍ය මිල රු. 10,000 ක් පමණ වන බවත්, ඒ අනුව රු. 47,052 ක් වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය. එම ඇස්තමේන්තුවේ විෂයය අංක 2 යටතේ තීන්ත ආලේපය සඳහා රු.22,775 ක් ගෙවා තිබුණද එම කාර්යය ද නිසි පරිදි ඉටුකර නොතිබුණි.

(ඇ) සතිපොළෙහි පොදු වැසිකිලියෙහි වල උතුරායාම හේතුවෙන් නව වැසිකිලි වලක් සැකසීම සඳහා රු.763,854 ක ඇස්තමේන්තුවක් යටතේ ඝන අඩි 1,600 ක ධාරිතාවයකින් යුතු වලක් ඉදිකිරීමට

සැළසුම් කර තිබුණද, පසුව සන අඩි 515 ක් දක්වා වෙනස්වීමට අදාළ සංශෝධිත ඇස්තමේන්තු අනුමත කරගෙන නොතිබුණි.

(ඈ) පොද්දෙනිකන්ද සිරියානවත්ත පාර පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය නිමකිරීමේදී බැම්මේ උස අඩි 12’ 6’’ ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණද පිහිටි ගල හමුවීම හේතුවෙන් උස අඩි 10’ 1’’ දක්වා අඩුව තිබුණද ඊට අදාලව සංශෝධිත ඇස්තමේන්තු අනුමතකර නොතිබුණි.

(i) බැම්මේ උස අඩුවීම අනුව ඉවත්කල යුතු පස් ප්‍රමාණය අඩු විය යුතු වුවත් ඇස්තමේන්තු මුදල වූ රු.22,228 ඉක්මවා රු. 50,013 ක් ගෙවා තිබුණි.

(ii) බැම්මේ උස අඩි 2’ 5’’ කින් අඩුව තිබීම හේතුවෙන් සක්කගල් බැම්ම සඳහා කියුබ් 02 කට ආසන්නව රු.48,860 ක පමණ මුදලක් අඩුවිය යුතු වුවත් ගෙවීම්වලින් රු.18,078 ක් පමණක් අඩුකර තිබුණි.

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය.

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන වලින් වැය විෂයයන් 7 ක එකතුව වූ රු. 759,750 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයයන් 31 ක ප්‍රතිපාදන වලින් සියයට 9 ත් සියයට 97 ත් අතර එකතුව වූ රු.31,620,361 ක ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි. වැය විෂයයන් 5 කට අදාළව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා සියයට 1 සිට සියයට 59 දක්වා රු.694,408 ක් වැයකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වාදුන් වැරදි නිවැරදි නොකිරීම |
| | (ii) ජර්නල් සටහන් සමඟ ඉදිරිපත් කරන සන්ලක්ෂ්‍ය පැහැදිලි නොවීම |
| | (iii) උපලේඛන ගිණුම් සමඟ නොසැසඳීම |
| | (iv) ගබඩා අත්තිකාරම් ක්‍රමය භාවිතා නොකිරීම |
| (ආ) ආදායම් පරිපාලනය | (i) හිඟ ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | (ii) ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා තිබුණද ඒ අනුව ලේඛන පවත්වා නොතිබීම |
| (ඇ) අයවැය පාලනය | (i) ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරිවීම් තිබීම |
| | (ii) ඇස්තමේන්තු ආදායම් අයකර නොගැනීම |
| (ඈ) වත්කම් පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | (ii) වාහනවල ඉන්ධන පරීක්ෂාව සිදු නොකිරීම |
| | (iii) සභාව භාවිතාකරන වෙනත් ආයතන සතු වාහන පවරාගැනීමට කටයුතු නොකිරීම. |